සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය .......................................................................................................................

ආයුර්වේද වෛද්‍යවරයෙන් වන අසේල විසින් ඉපැරණි අයුර්වේද වට්ටෝරුවට අනුව කැලෑබඳ ප්‍රදේශ වලින් සොයාගන්නා ලද ශාකසාර යොදා ගනිමින් කොවිඩ් රෝගීන් සඳහා 'සුවසහන' නමින් ඖෂධීය පානයක් නිෂ්පාදනය කරන ලද අතර එය පානය කල බොහෝ කොවිඩ් රෝගීන් ඉක්මනින් සුවපත් වීම දකින්නට ලැබිනි.

01. ඉහත සිද්ධියට අදාළව ඉටු කරනු ලබන අවශ්‍යතාවය වන්නේ

1. ආහාර    2. අධ්‍යාපනය    3. සෞඛ්‍ය    4. ඇඳුම්

02. මෙම 'සුවසහන' නැමැති ඖෂධීය පානය

1. සම්පත්ය    2. සේවාවකි    3. යෙදවුමකි    4. නිෂ්පාදනයකි

03. අසේල සතු ශක්තියක් වන්නේ,

1. ආයුර්වේද මධ්‍යස්ථානයක් පවත්වා ගෙනයාම
2. කොවිඩ් රෝගයේ ව්‍යාප්තිය.
3. ආයුර්වේද වෛද්‍යවරයෙක් වීම.
4. රෝගීන් සුවපත් වීම.

04. ඖෂධිය ශාකසාර අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ

1. ප්‍රාග්ධනය    2. ව්‍යවසාය    3. භූමිය    4. ශ්‍රමය

05. සිද්ධියට අදාළව වෙළඳපල අවස්ථාවක් වන්නේ

1. 'සුවසහන' පානය කල රෝගීන් ඉක්මනින් සුවපත් වීම.
2. කොවිඩ් රෝගයේ ව්‍යාප්තිය.
3. කැලෑබඳ ප්‍රදේශවලින් හැකිතරම් ශාකසාර සපයාගත හැකිවීම.
4. කොවිඩ් රෝගය සඳහා අනුමත වෛද්‍ය ප්‍රතිකාරයක් නොමැති වීම.

06. සේවා සැපයීමේ ව්‍යාපාරයක් නොවන්නේ

1. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.
2. මහජන බැංකුව.
3. ගුවන් විදුලි සංස්ථාව.
4. සමූපකාර තොග වෙළඳ සංස්ථාව.

07. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන් අතුරෙන් නිෂ්පාදිත සාධාරණ මිලට ලබාගැනීම හා ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම බලාපොරොත්තු වන්නේ

1. සැපයුම්කරුවන්ය.
2. තරඟකරුවන්ය.
3. ගනුදෙනුකරුවන්ය.
4. ප්‍රජාවය.

08. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධකය වන්නේ

1. ගනුදෙනුකරුවන්, අයිතිකරුවන්, සේවකයන්

2. ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරගකරුවන්

3. අයිතිකරුවන්, සැපයුම්කරුවන්, කලමනාකරුවන්

4. අයිතිකරුවන්, කලමනාකරුවන්, සේවකයන්

09. මෙරට පාරිභෝගිකයන් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන නීතිය කුමක්ද?

1. 1972 අංක 05 දරණ සමූපකාර පනත

2. 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත

3. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම අඥාපනත

4. 1890 හවුල් ව්‍යාපාර අඥා පනත

10. ආර්ථික පරිසරයට අයත් සාධක ඇතුලත් කාණ්ඩය වන්නේ

1. බැංකු පොළී අනුපාතය, ඇයවැය ප්‍රතිපත්තිය, ඩිජිටල් තාක්‍ෂණය

2. රැකියා නියුක්තිය, විදේශ විනිමය අනුපාතය, ආදායම් ව්‍යාප්තිය

3. විදේශ විනිමය අනුපාතය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත, යටිතල පහසුකම් ඇති කිරීම

4. විද්‍යුත් තැපෑල, උද්ධමනය, විදේශණය

11. ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමක් වන්නේ

1. විදේශීය ප්‍රාග්ධනය රටතුලට ගලා ඒම

2. නවීන තාක්ෂණය ලබාගත හැකිවීම

3. දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම

4. නවීන තාක්ෂණය ලබාගත අපහසුවුවීම

12. ව්‍යාපාරයක ප්‍රාග්ධනය, සේවක සංඛ්‍යාව, භාවිතා කරන බලශක්ති ප්‍රමාණය, ව්‍යාපාරයට ඇති වෙළඳපල කොටස යන සාධක යොදා ගෙන ව්‍යාපාර වර්ගීකරණය කරනු ලබන්නේ

1. අරමුණ අනුව ව්‍යාපාර වර්ග කිරිමේදීය

2. හිමිකාරත්වය අනුව ව්‍යාපාර වර්ග කිරිමේදීය

3. පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කිරිමේදීය

4. ලාභදායිත්වය අනුව ව්‍යාපාර වර්ග කිරිමේදීය

13. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු අවම හා උපරිම සාමාජික සංඛ්‍යාව වන්නේ

1. අවම 01ක් උපරිම 20 ත් අතර

2. අවමය 02 ත් උපරිම 10 ත් අතර

3. අවමය 02 ත් උපරිම 20 ත් අතර

4. අවමය 02 ත් උපරිම 50 ත් අතර

14. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම හා ස්වෙච්චාවෙන් එකට එකතු වී සාමුහිකව කටයුතු කිරීම අරමුණ කරගත් ව්‍යාපාර සංවිධාන වර්ගයක් වනුයේ

1. සීමාසහිත ටෙලිකොම් සමාගම

2. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

3. ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය

4. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

15. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් යටතේ ආරම්භ වූ නෛතික පුද්ගලභාවයක් හිමි සංවිධාන වර්ගයක් වනුයේ

1. අධ්‍යාපන අමාත්‍යාංශය

2. විදේශ සේවා නියුක්ති කාර්යංශය

3. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

4. ශ්‍රී ලංකා ටෙලිකොම්

16. ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි වාසියක් නොවන්නේ

1. ණය ලබාගැනීමේ පහසුවක් ලැබීම

2. අනන්‍යතාවක් ලැබීම

3. ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම

4. නීතිමය පුද්ගලභාවයක් තිබීම

17. ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වන්නේ

1. ලාභය මැන බැලීමයි

2. අයිතිකරුගේ හිමිකම ගණනය කිරීමයි

3. ඇල්මැති පාර්ශවයන්ට අවශ්‍යය තොරතුරු සැපයීමයි

4. නීතිමය අවශ්‍යතා ඉටු කිරීමයි.

18. ව්‍යාපාරික ගණුදෙනු යනු,

1. ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරුවකි

2. ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන අත්පිට ගණුදෙනුවකි

3. ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන ණය ගණුදෙනුවකි

4. රු. 10000ක බඩු තොගයක් විනාශ වීමයි

19. වත්කමක ලක්ෂණයක් නොවන්නේ

1. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම

2. වර්තමාන බැදීමක් තිබීම

3. අනාගතයේ ව්‍යාපාරය තුලට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

4. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම

20. පහත දැක්වෙන පිළිතුරු අතරින් වැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

1. වත්කම් = හිමිකම් + වගකීම්

2. වත්කම් - හිමිකම් = වගකීම්

3. වත්කම් - වගකීම් = හිමිකම්

4. හිමිකම් = වත්කම් + වගකීම්

21. ව්‍යාපාරයක සිදුවන ගණුදෙනු අතරින් ආදායම් යන්නට අයත් නොවන්නේ කුමක්ද?

1. විකුණුම්

2. පොලී ලැබීම්

3. කුලී ලැබීම්

4. අතිරේක ප්‍රාග්ධනය යෙදීම

22. නෙත්මි ව්‍යාපාරයේ 2022-01-01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| ලීබඩු උපකරණ රු. 300,000 | | | | |
| මුදල් රු. 50000 | | ප්‍රාග්ධනය රු. 265000 | | ණයහිමියෝ රු. 8500 |

මෙම ව්‍යාපාරයේ අයිතිකරු රු. 25000ක් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන ගියේ නම් ගිණුම්කරණ සමීකරණය කෙසේ වේද?

| වත්කම් (රු) | = | හිමිකම් (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| 1. 350000 | = | 240000 | + | 110000 |
| 2. 325000 | = | 240000 | + | 85000 |
| 3. 325000 | = | 265000 | + | 60000 |
| 4. 350000 | = | 265000 | + | 85000 |

23. ද්විත්ව කාර්යයක් ඉටුකරන මූලික පොතක් වන්නේ

1. පොදු ජ'නලය  2. විකිණුම් ජ'නලය
3. ගැණුම් ජ'නලය  4. මුදල් පොත

24. ගැනිලි ගිණුම අයත්වන්නේ පහත සඳහන් ගිණුම් අතරින් කුමකටද?

1. ආදායම් ගිණුම්  2. වියදම් ගිණුම්
3. හිමිකම් ගිණුම්  4. වගකීම් ගිණුම්

25. ගණුදෙනුවක ද්විත්ව බලපෑම මෙසේ සාරාංශ කර ඇත.

වියදම් වැඩිවීම

වත්කම් අඩුවීම

මේ සඳහා ගැළපෙන ගණුදෙනු වන්නේ

1. රු. 50000ක බැංකු ණයක් ලබාගැනීමය
2. රු. 10000ක සේවක වැටුප් ගෙවීමය
3. ණය වාරිකය ලෙස රු. 4000ක් ගෙවීමය
4. ණයගැතියන්ගෙන් රු. 3000ක් ලැබීමය

26. රෙදිපිළි වෙළෙඳ ව්‍යාපාරයක් විසින් බතික් සාරියක් රු. 2000 බැගින් බතික් සාරි 50ක් 10%ක වෙළෙඳ වට්ටමක් යටතේ ණයට ගන්නා ලදී. දින 30ක් තුල ණය බේරුම් කරන්නේ නම් 5%ක මුදල් වට්ටමක් ද හිමිවන බව ඉන්වොයිසියේ සඳහන් වේ. ගැණුම් ජ'නලයේ සටහන් විය යුතු වටිනාකම කොපමණද?

1. රු. 85000  2. රු. 90000  3. රු. 95000  4. 100000

27. පසිඳු පොත් ප්‍රකාශකයින්ගේ ව්‍යාපාරයේ සිදුව ඇති ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ

A - A4 කඩදාසි පැකට් 10ක් මිලටගත්තා රු. 4000

B - විනක්ෂණ ව්‍යාපාරයෙන් මුද්‍රණ යන්ත්‍රයක් ණයට ගත්තා රු. 50000

C - මුද්‍රණ කඩදාසි තොගයක් කපිලට විකුණුවා රු. 10000

D - මුද්‍රිත පොත් තොගයක් වික්කා රු 25000

ඉහත ගණුදෙනු වලින් විකුණුම් ජ'නලයේ සටහන් වන ගණුදෙනු වන්නේ,

1. A පමණි 2. B පමණි 3. C පමණි 4. C හා D පමණි

28. සචිත්ගේ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 55000ක වටිනා යන්ත්‍රයක් 2021-07-16 දින හරිත්ගෙන් ලබා ගන්නා ලදි

මෙම ගණුදෙනුව සචිත්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කලයුතු මූලික පොත වන්නේ

1. ගැණුම් ජ'නලයයි 2. පොදු ජ'නලයයි

3. මුදල් පොතයි 4. විකුණුම් ජ'නලයයි

29. චෙක්පත් වලින් කරන ගෙවීම් වලට අදාල මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙලින්

1. ලදුපත හා බැංකු ගිණුම 2. වවුචරය හා බැංකු ගිණුම

3. පිළිපත හා බැංකු ගිණුම 4. ජ'නල් වවුචරය හා බැංකු ගිණුම

30. බැංකු ගිණුමක් සංශෝධනය කිරීමේදී අදාල කර නොගන්නා අයිතමය වන්නේ

1. නිශ්කාශනය නොවු චෙක්පත් රු. 7800

2. ස්ථාවර නියෝග මත ගෙවූ රක්‍ෂණය රු. 3100

3. බැංකු ගාස්තු රු. 600

4. ණයගැති ප්‍රේෂණ රු. 2300

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

2021 සැප්තැම්බර් 30 දිනට බැංකු ගිණුම් ශේෂය රු. 14100 ක් විය. පහත සඳහන් හේතුනිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.

A - තැන්පත් කල නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 10000 කි.

B - බැංකුවට ඍජුව ලැබී ඇති ප්‍රේෂණ රු. 3000 කි.

C - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්‍ෂණ ගාස්තුව රු. 4000 කි.

31. ඉහත හේතු ඇසුරින් බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩිවීමට බලපාන හේතුව/හේතු වන්නේ,

1. A පමණි 2. B පමණි

3. A හා C පමණි 4. B හා C පමණි

32. 2021 සැප් 30 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය වන්නේ,

a b

1. රු. 5100 2. රු. 13100

3. රු. 14100 4. රු. 21100

33. 2022-01-01 දින .................. විසින් රු. 3000ක මුදලක් ................ ලෙස සුළු මුදල් භාරකරුට ලබාදෙන ලදි.

මෙහි a,b හිස්තැන් සඳහා පිළිවෙලින් ගැළපෙන පිළිතුරු වන්නේ,

1. ප්‍රධාන මුදල් භාරකරු, සුළු මුදල් අග්‍රිමය ය

2. සුළු මුදල් භාරකරු, මුදල් පොත ය

3. සුළු මුදල් භාරකරු, සුළු මුදල් අග්‍රිමය ය

4. ප්‍රධාන මුදල් භාරකරු, සුළු මුදල් පොතය

(34) කසුන්ගේ ව්‍යාපාරයේ 2021 වර්ෂයට අදාල තොරතුරු පහත දැක්වේ

- 2021-01-01 දිනට ප්‍රාග්ධන ශේෂය රු. 300000
- වර්ෂයේ මුළු ආදායම් රු. 525000
- වර්ෂයේ මුළු වියදම් රු. 382000

වර්ෂය තුල යෙදූ අමතර ප්‍රාග්ධනය රු. 60000කි. මෙම තොරතුරු අනුව 2021-12-31 දිනට කසුන්ගේ හිමිකම කොපමණද?

1. රු. 217000
2. රු. 383000
3. රු. 443000
4. රු. 503000

35. ශේෂ පිරික්සුමක බැර තීරුවේ ඇතුලත් වන ගිණුම් ශේෂ පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. ප්‍රචාරණය, ණයපොලී, සේවක වේතන
2. විකුණුම්, ගැනිලි, ගෙවල්කුලී ආදායම්
3. ණයහිමියෝ ලද කොමිස්, බැංකුණය
4. ලී බඩු, යන්ත්‍ර, ගොඩනැගිලි

36. තොග මිලදී ගැනීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

1. තොග ගිණුම හර මුදල් ගිණුම බැර
2. ගැණුම් ගිණුම හර මුදල් ගිණුම බැර
3. තොග ගිණුම හර ණයහිමි ගිණුම බැර
4. ගැණුම් ගිණුම හර ණයහිමි ගිණුම බැර

37. වෙළෙඳ වට්ටම් හා මුදල් වට්ටම් සම්බන්ධයෙන් කියවෙන පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. වෙළෙඳ වට්ටම් ගිණුම්ගත කරන අතර මුදල් වට්ටම් ගිණුම්ගත නොකෙරේ.
2. මුදල් වට්ටම් ගිණුම්ගත කරන අතර වෙළෙඳ වට්ටම් ගිණුම් ගත නොකෙරේ.
3. වෙළෙඳ වට්ටම් මෙන්ම මුදල් වට්ටම් ද ගිණුම්ගත කෙරේ.
4. වෙළෙඳ වට්ටම් මෙන්ම මුදල් වට්ටම් ද ගිණුම්ගත නොකෙරේ

38. ව්‍යාපාරයක් විසින් 2020 මාර්තු 31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 90000 ක් වූ අතර බැර තීරුවේ එතතුව රු. 92500 ක් විය. මෙම වෙනසට හේතුවිය හැක්කේ

1. දුන් වට්ටම් ගිණුමේ එකතුව රු. 2500 කින් වැඩිවීමයි.
2. විකුණුම් ගිණුමේ එකතුව රු. 2500 කින් අඩුවීම.
3. ගැණුම් ගිණුමේ එකතුව රු. 2500 කින් වැඩිවීමයි.
4. ලද වට්ටම් ගිණුමේ එකතුව රු. 2500 කින් වැඩිවීමයි.

39. පහත සදහන් වැරදි අතුරෙන් ශේෂ පිරික්සුමේ වෙනසක් ඇති කරන වරදක් වන්නේ,

1. විදුලි ගාස්තු රු. 1000 ක් ගෙවීම ගිණුම් දෙකේම හරට සටහන් කිරීම.
2. යන්ත්‍ර අළුත්වැඩියා සදහා ගෙවූ රු. 1500 ක් යන්ත්‍ර ගිණුමට හර කිරීම.
3. රු. 20000 ක වැටුප් ගෙවීම රු. 2000 ක් ලෙස ගිණුම්වල සටහන් කිරීම.
4. රු. 1000 ක රක්ෂණ ගාස්තු ගෙවීම ගිණුම්වල දෙවරක් සටහන් කිරීම.

40. පහත සඳහන් වත්කම් වලින් ජංගම නොවන වත්කමක් වන්නේ,

1. ණයගැතියෝ ය.
2. මුදල් ය.
3. යන්ත්‍රෝපකරණ ය.
4. බැංකු ශේෂය ය.

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය

## II කොටස

■ **පහත සිද්ධිය ඇසුරෙන් 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

කමල් ඇදුම් නිර්මාණකරණය පිළිබඳ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු ආයතනයෙන් ඩිප්ලෝමාවක් ලබාගත් තැනැත්තෙකි. කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ නිලධාරීන් හට ආරක්ෂිත ඇඳුම් මැසිමේ ව්‍යාපාරයක් 'කමල් ටේලර්ස්' නමින් 2021.01.01 දින ඔහු විසින් ආරම්භ කරන ලදි. සෞඛ්‍ය ආරක්ෂිත ඇදුම් වලට අමතරව වැඩිහිටියන්ට සහ කුඩා දරුවන්ට සුදුසු මුහුණු ආවරණ (Face Marsk) ද ඔහු විසින් නිෂ්පාදනය කරන ලදි. 2021.01.01 ප්‍රාග්ධනය ලෙස තමා ඉතිරිකරගත් රු. 200000 ක මුදලක්ද රු. 700000 ක් වටිනා ත්‍රිවිලරයද යොදවන ලදි. මනා ලෙස පුහුණුව ලැබූ ඇදුම් මසන්නෙකුද රු. 25000ක මාසික වැටුපකට ඔහු විසින් බඳවා ගන්නා ලදි.

ජනවාරි මාසය තුල පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

| | | |
|---|---|---|
| 2021.01.01 | : | ඇදුම් මැසීම සදහා රු. 25000 කට මහන මැෂිමක් මිලදී ගත්තා |
| | | මෙදිනම රු. 50000 ක ණය මුදලක් ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදි. |
| 2021.01.02 | : | සෞඛ්‍ය ආරක්ෂිත ඇදුම් මැසිම සදහා අමු ද්‍රව්‍ය ගැනුම් රු. 30000 |
| 2021.01.03 | : | සෞඛ්‍ය ආරක්ෂිත මුහුණු ආවරණ මැසිම සඳහා අමුද්‍රව්‍ය සදහා ගැනුම් රු. 10000 |
| 2021.01.04 | : | ප්‍රවාහන කුලි 2000 |
| 2021.01.05 | : | දුරකථන බිල 1500 |
| 2021.01.08 | : | විකුණුම් රු. 30000 |
| 2021.01.14 | : | සෙන්ට්‍රල් පාමසියට විකුණුම් රු. 10000 |
| 2021.01.20 | : | වැටුප් ගෙව්වා රු. 20000 |
| 2021.01.25 | : | බැංකු ණය වාරික ගෙව්වා රු. 5000 |

1. අ. මෙම ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාවය හා වුවමනාව නම් කරන්න.

   ආ. නිශ්පාදනය කරනු ලබන නිශ්පාදිත වල ස්වභාවය අනුව කුමන වර්ගයේ ව්‍යාපාරයක්ද?
2. අ. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් 02ක් ලියන්න.

   ආ. මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් 02ක් නම් කරන්න.
3. ඉහත ව්‍යාපාරයේ දැකියහැකි නිශ්පාදන සාධක 02ක් නම්කර උදාහරණ දක්වන්න.
4. ඉහත සිද්ධිය අදාල රාජ්‍ය ආයතන 02ක් නම් කරන්න. එම ආයතන අයත් වන්නේ කුමන සංවිධාන වර්ගයකටද?
5. 2021.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය දක්වන්න.
6. ව්‍යාපාරය විසින් පවත්වාගතයුතු මූලික සටහන් පොත් 02ක් නම්කර මූලාශ්‍ර ලේඛන දක්වන්න.
7. 2021.01.31 දිනට මුදල් ශේෂය ගනනය කර දක්වන්න.
8. 2021.01.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කමක් හා ජංගම වත්කමක් දක්වන්න.
9. 2021.01.14 දින ගනුදෙනුවට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.
10. 2021.01.31 දිනට වගකීම් හා හිමිකම් කොපමණද?

## ව්‍යාපාර අධ්‍යනය - II කොටස

**ප්‍රශ්න 02ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

2. (i) අ. මිනිස් අවශ්‍යතාවක් යනු කුමක්ද?

   ආ. මිනිස් අවශ්‍යතාවක ලක්ෂණ 02ක් ලියන්න. (ල.2)

(ii) පහත සදහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ. ව්‍යාපාරිකයන්ට මිනිස් අවශ්‍යතා නිර්මාණය කලහැකි අතර වුවමනා නිර්මාණය කල නොහැක (..........)

ආ. නිශ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර නිශ්පාදන ව්‍යාපාර හා සේවා ව්‍යාපාර ලෙස වර්ග කෙරේ (..........)

ඉ. භාණ්ඩ හා සේවා නිශ්පාදනය කරන ව්‍යාපාර නිශ්පාදන කටයුතු සඳහා යොදාගන්නා ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ (..........)

ඊ. ව්‍යාපාරයක් සෑම අවස්ථාවකදීම ලාභ අරමුණු කරගෙන පවත්වා ගෙන යනු ලැබේ (..........)

(ල.02)

(iii) ගෙවතු අලංකරණය සඳහා බිම අතුරන ගල් (inter look) සඳහා විශාල ඉල්ලුමක් පවතින බැවින් සුනිමල් විසින් බිම අතුරන ලද ගල් නිශ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඒ සඳහා ඔහු විසින් (inter look) ගල් නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගත් අතර පළපුරුදු සේවකයකුද බඳවා ගන්නා ලදී.

අ. ඉහත සිද්ධියට අදාළව නිෂ්පාදන සාධක 02 ක් දක්වා උදාහරණ දක්වන්න.

ආ. ඉහත සිද්ධියට අදාලව ඇල්මැති පාර්ශ්වයන් යනු කවුරුන්ද ? (ල.02)

(iv) ඇවිදින මංතීරුවක් අසල කොළකැඳ ව්‍යාපාරයක් පවත්වා ගෙනයන ශිරාණි ගේ අරමුණ වනුයේ ගුණත්වයෙන් ඉහල අඩු මිලකට කොළකැඳ සැපයීමයි. මේ හේතුව නිසා අනෙකුත් කොළකැඳ ව්‍යාපාරිකයන්ට වඩා ඉහල ඉල්ලුමක් ශිරාණිගේ කොළකැඳ ව්‍යාපාරයට පවතී.

අ. මේ සිද්දියට අදාළව කොළකැඳ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශවයන් 02ක් නම් කර උදාහරණ දක්වන්න.

ආ. එම ඇල්මැති පාර්ශ්වයන් ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන්නට හේතු වූ කරුණ බැගින් ලියන්න. (ල.02)

03. (i) අ. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

ආ. අභ්‍යන්තර පරිසර සාධක 02ක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද දක්වන්න.

අ. ගනුදෙනුකරුවන් ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයකි. (............)

ආ. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය තුලින් ව්‍යාපාරිකයන්ට ඇති තර්ජන හා අවස්ථා හඳුනාගත හැක. (...........)

ඉ. පාරිභෝගිකයන් ගේ ජීවන රටාව වෙනස්වීම ව්‍යාපාරයට ඇති තර්ජනයකි. (...........)

ඊ. විදේශීය ප්‍රාග්ධනය රටතුලට ගලාඒම ගෝලීය පරිසරයෙන් සිදුවන යහපත් බලපෑමකි. (............)

(ල.02)

(iii) සයිබර් ප්‍රහාර හේතුවෙන් ලෝකයේ ප්‍රධාන පෙළේ ව්‍යාපාර රාශියක් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පාන්නට සිදුව ඇති බව රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදක විසින් ප්‍රකාශ කරන ලදි.

අ. ඉහත කී සිද්ධියට අදාල ව්‍යාපාර පරිසරය කුමක්ද?

ආ. රජය විසින් ව්‍යාපාර වලට නීතිරීති පැනවීමේ අරමුණු 02 ක් සඳහන් කරන්න. (ල.02)

(iv) රජය විසින් රසායනික පොහොර ආනයනය තහනම් කිරීමත් සමඟ කාබනික පොහොර සඳහා ඇති ඉල්ලුම වැඩිවිය.

අ. ඉහත සිද්ධියට අදාලව රසායනික පොහොර ආනයනය තහනම් කිරීම අයත් වන්නේ කිනම් ව්‍යාපාර පරිසර සාධකයටද?

ආ. කාබනික පොහොර අයත් වන්නේ කිනම් නිශ්පාදන සාධකයටද? (ල.02)

04. (i) අ. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ආකාරය රූප සටහනක් මගින් දක්වන්න.

ආ. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදි යොදාගන්නා ප්‍රමාණාත්මක නිර්නායක 02 ක් දක්වන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍යද අසත්‍යද දක්වන්න.

අ. වගකීම අසීමිත වීම තනි පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි වාසියකි (...........)

ආ. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සාමාජික සංඛ්‍යාව තීරණය වන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුවය. (............)

ඉ. සමූපකාර සමිති ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි. (..........)

ඊ. සංස්ථාපිත සමාගමක සාමාන්‍ය කොටස් මිළදීගත් පුද්ගලයෙකු හෝ ආයතනයක් එම සමාගමේ අයිතිකරුවන් බවට පත්වේ (...........) (ල.02)

(iii) කමල් හා විමල් එක්ව පාසැල් ලිපි ද්‍රව්‍ය හා උපකරන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යන ලදි. ප්‍රාග්ධනය රු. 100000ක් වූ අතර එය දෙදෙනා විසින් සම සමයුව යොදන ලදි.

අ. මෙම සිද්ධියට අදාලව දෙදෙනා විසින් යෙදූ ප්‍රාග්ධනය රු. 100000 ට වැඩි බැවින් ඔවුන් කටයුතු කල යුත්තේ කිනම් පනතට අනුවද?

ආ. එම පනතට අනුව ඔවුන් කටයුතු කළ යුත්තේ කෙසේද? (ල.02)

(iv) ඇඳුම් මැසීම පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන රුවිනි පෙරේරා 'රුවිනි ටෙක්ස්' නමින් ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

අ. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කල යුතුද? හේතු දක්වන්න.

ආ. ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ 02ක් දක්වන්න.

## ගිණුම්කරණය - II කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. (i) අ. මූලාශ්‍ර ලේඛන යනු මොනවාද? (ලකුණු 01)

ආ. පහත සඳහන් එක් එක් මූලික සටහන් පොත් වල ගණුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛනය බැගින් නම් කරන්න.

a - බැංකු ගිණුම

b - පොදු ජ'නලය

c - සුළු මුදල් පොත

d - ගැණුම් ජ'නලය (ලකුණු 01)

(ii) පහත සඳහන් වන්නේ මෙත්මල් ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනුවේ. ඒවා මුදල් පොතක සටහන් කරන්න.

| | | රුපියල් |
|---|---|---|
| 2022.01.01 | ප්‍රාග්ධනය යෙදවීම | 200000 |
| 01.03 | අත්පිට ගැණුම් | 160000 |
| 01.06 | අත්පිට විකුණුම් | 155000 |
| 01.13 | බැංකු ණය ගැනීම | 100000 |
| 01.17 | කඩකුළී ගෙවීම | 48000 |
| 01.20 | සේවක වැටුප් ගෙවීම | 40000 |
| 01.27 | දුරකථන ගාස්තු ගෙවීම | 2000 |
| 01.30 | විදුලි ගාස්තු ගෙවීම | 5000 |

(ලකුණු 04)

(iii) ලසන්තගේ ව්‍යාපාරයේ මාර්තු මාසය තුල සිදු වූ ගණුදෙනු වලින් ගිණුම්කරණ සමීකරණයට සිදු වූ බලපෑම පහත සඳහන් පරිදි වේ.

| | වත්කම් | | | | = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | පරිගණක + | ණයගැතියෝ + | බඩුතොග + | මුදල් | = | ප්‍රාග්ධනය + | ණයහිමියෝ |
| 1. 03/05 | - | - | - | + 200000 | = | +200000 | |
| 2. 03/08 | - | - | +25000 | - | = | - | +25000 |
| 3. 03/10 | - | +30000 | -20000 | - | = | +10000 | - |
| 4. 03/30 | +50000 | - | - | -50000 | = | - | - |

එක් එක් දින ව්‍යාපාරයේ සිදු වී ඇතැයි අනුමාන කරන ගණුදෙනුවක් බැගින් ලියන්න. (ලකුණු 04)

(iv) අ. බැංකු ප්‍රකාශනය යනු කුමක්ද? (ලකුණු 01)

ආ. ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස්වීම හේතුවිය හැකි කරුණක් සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 12)

6. අ. පහත දී ඇති තොරතුරු ඇසුරින් මලිතිගේ ව්‍යාපාරයේ සුළු මුදල් පොත පිළියෙල කරන්න.

මේ සඳහා ගමන් වියදම්, සංග්‍රහ වියදම්, තැපැල් වියදම් යන විශ්ලේෂන තීරු භාවිත කරන්න.

| | | |
|---|---|---|
| 2022-02-01 | අග්‍රිමය ලැබුනා | රු. 2000 |
| 02.03 | ගමන් ගාස්තු ගෙව්වා | රු. 150 |
| 02.04 | සීනි සහ තේ කොළ මිලට ගත්තා | රු. 175 |
| 02.08 | තිලුපුල්ට ගෙව්වා | රු. 600 |
| 02.12 | මුද්දර හා ලිපි කවර ගත්තා | රු. 180 |
| 02.18 | ත්‍රීරෝද රථ ගාස්තු ගෙව්වා | රු. 200 |
| 02.20 | සිසිල් බීම මිලදී ගත්තා | රු. 150 |
| 02.24 | ලිපි ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙව්වා | රු. 210 |
| 02.27 | බස් ගාස්තු ගෙව්වා | රු. 300 |
| 03.01 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කලා | |

(ලකුණු 06)

ආ. පහත දැක්වෙන්නේ 2021 දෙසැම්බර් මාසය සඳහා ව්‍යාපාරයක් විසින් පිළියෙල කල බැංකු ගිණුම් සහ බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයයි.

බැංකු ගිණුම

| දිනය | ල.අ | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | ව.අ | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12 /1 | | ශේෂය ඉ/ගෙ | | 20000 | 12/7 | | ණයහිමියන් 8615 | | 5000 |
| 12/10 | | චෙත් තැන්පත් 5625 | | 10000 | 12/10 | | කඩකුලී 8616 | | 4000 |
| 12/25 | | චෙක්පත් තැන්පත් 4663 | | 15000 | 12/28 | | ගැණුම් 8617 | | 11000 |
| | | | | | 12/31 | | ශේෂය ප/ගෙ | | 25000 |
| | | | | 45000 | | | | | 45000 |
| 01/01 | | ශේෂය ඉ/ගෙ | | 25000 | | | | | |

බැංකු ප්‍රකාශනය

| දිනය | ඉ.අ | සැපයුම්කරු | මුළු වටිනාකම රු. | ලෙ.පි |
|---|---|---|---|---|
| 01/10 | 007 | විමල් | 5000 | |
| 01/18 | 216 | සුනෙත් | 16 000 | |
| 01/25 | 720 | ජගත් | 5000 | |

අවශ්‍ය වන්නේ,

1. 2021 දෙසැ 31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය (ලකුණු 02)
2. 2021 දෙසැ 31 දිනට බැංකු සැසඳුම් විස්තර (ලකුණු 04)

7. අ. 2022 ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයක් විසින් පිලියෙල කල ගැණුම් ජ'නලය හා විකුණුම් ජ'නලය පහත දැක්වේ.

ගැණුම් ජ'නලය

| දිනය | ඉ.අ | සැපයුම්කරු | මුළු වටිනාකම රු. | ලෙ.පි |
|---|---|---|---|---|
| 01/05 | 007 | වෙනුර | 5000 | |
| 01/16 | 216 | සිල්වා | 8000 | |
| 01/22 | 720 | විහඟි | 10000 | |

විකුණුම් ජ'නලය

අවශ්‍යය වන්නේ

1. ඉහත දැක්වෙන ගැණුම් ජ'නලය හා විකුණුම් ජ'නලය 2022-01-31 දිනට සම්පූර්ණ කිරීම
2. ඉහත ගැණුම් හා විකුණුම් ජ'නල්වල ඇතුලත් ගණුදෙනු ගිණුම්වලට පිටපත් කිරීම (ලකුණු 06)

ආ. පහත දැක්වෙන ගණුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලියා දක්වන්න.

1. රු. 30000 න බඩුතොග අත්පිට මුදලට විකිණීම
2. ණයගැතියෙකුගෙන් රු. 12000 ක මුදලක් ලැබීම
3. බැංකු ණය වාරික ලෙස රු. 8000 න් ගෙවීම
4. අයිතිකරු සතු රු. 100000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයට යෙදවීම.
5. රු. 3000 ක මුදලක් ණයහිමියන්ට ගෙවීම
6. රු. 4000 ක රක්‍ෂණ ගාස්තුවක් ගෙවීම

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்**

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

**10 ශ්‍රේණිය** | **ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු**

# I පත්‍රය

(17) 3 (18) 1 (19) 4 (20) 4 (21) 4 (22) 2 (23) 4 (24) 3 (25) 2 (26) 2 (27) 3 (28) 2
(29) 2 (30) 1 (31) 3 (32) 2 (33) 1 (34) 4 (35) 3 (36) 2 (37) 2 (38) 4 (39) 1 (40) 3

# II පත්‍රය

## II කොටස - ගිණුම්කරණය

(5) (i) (අ) ව්‍යාපාර ගණුදෙනු සිදුවූ විට ගණුදෙනුව පිළිබඳව සියලු විස්තර ඇතුලත් කොට මුලින්ම පිළිලෙ කරන ලේඛනය මූලාශ්‍ර ලේඛනය වේ. (ලකුණු 01)

(ආ) a - බැංකු ගිණුම - තැන්පත් කිරීමේ කුවිතාන්සි/ගෙවීම් වවුචර්/බැංකු ප්‍රකාශය/ අගුරු චෙක්පත් දනුම්දීමේ නිවේදනය

b - පොදු ජ'නලය - ජ'නල් වවුචරය

c - සුළු මුදල් පොත - සුළු මුදල් ගෙවීම් වවුචරය

d - ගැනුම් ජ'නලය - ගැණුම් ඉන්වොයිසිය (ලකුණු 01)

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය සා.පි | වටිනාකම රු |
|---|---|---|---|---|---|---|
| 2022/01/01 | ප්‍රාග්ධන ගිණුම | | 200, 000 | 2022/01/03 | ගැණුම් ගිණුම | 160, 000 |
| 01/06 | විකුණුම් ගිණුම | | 155, 000 | 2022/01/07 | කඩ කුළී ගිණුම | 160, 000 |
| 01/13 | බැංකු ණය | | 100 000 | 2022/01/20 | සේවක වැටුප් | 4, 000 |
| | | | | 2022/01/27 | දුරකථන ගාස්තු | 2, 000 |
| | | | | 2022/01/30 | විදුලි ගාස්තු | 5, 000 |
| | | | | 2022/01/31 | ශේෂය ප/ගෙ | 200, 000 |
| | | | 455 000 | | | 455, 000 |
| 02/01 | ශේෂය ඉ/ගෙ | | 200 000 | | | |

ඕනෑම නිවැරදි අයිතම දෙකකට ලකුණු 01 බැගින් (ලකුණු 04)

(iii) (1) මුදලින් රු. 200, 000 ක් ව්‍යාපාරයේ ආයෝජනය කිරීම.

(2) රු. 25,000 ක් වන බඩුතොගයක් ණයට ලබාගැනීම.

(3) පිරිවැය රු. 20,000 ක් වූ බඩුතොගයක් රු 30,000 කට ණයට විකිණීම.

(4) රු. 50,000 ක් වටිනා පරිගණකයක් අත්පිට මුදලට ලබාගැනීම.

(නිවැරදි පිළිතුරකට ලකුණු එක බැගින් ) (ලකුණු 04)

(iii) (අ) වාණිජ බැංකුව විසින් ජංගම ගිණුම් හිමියෙකු වෙත නිශ්චිත කාලපරිච්ඡේදයක් (සාමාන්‍යයෙන් මසක්) තුළ ජංගම ගිණුම තුළින් සිදුකළ ගණුදෙනු පිළිබඳව එවනු ලබන විස්තරාත්මක වාර්තාවක් වේ. (ලකුණු 01)

(ආ) 1. නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්

2. නිකුත් කල නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් (එක් කරුණකට ලකුණු 01) (ලකුණු 12)

06. (අ) සුළු මුදල් පොත

| ලැබීම් | ම.නි. | දිනය | විස්තරය | ව.අ | ගෙවීම රු. | විශ්ලේෂණ තීරු | | | ලෙජර් ගිණුම රු. | ලෙ පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් වියදම් | සංග්‍රහ වියදම් | තැපැල් වියදම් | | |
| 2000* | | 2022 02/01 | මුදල් ආග්‍රිමය ලැබුණා | | | | | | | |
| | | 02/03 | ගමන් ගාස්තු | | 150 | 150 | | | | |
| | | 02/04 | සීනි සහ තේකොළ | | 175 | | 175 * | | | |
| | | 02/08 | නිලුපුල් | | 600 | | | | 600* | |
| | | 02/08 | මුද්දර හා ලිපි කවර | | 120 | | | *190 | | |
| | | 02/18 | ත්‍රී රෝද රථ ගාස්තු | | 200 | 200* | | | | |
| | | 02/20 | සිසිල් බීම | | 150 | | 150* | | | |
| | | 02/24 | ලිපි ලියා පදිංචි ගාස්තු | | 210 | | | 210* | | |
| | | 02/27 | බස් ගාස්තු | | 300 | 300* | | | | |
| | | | | | 1975 | 650 | 325 | 400 | 600 | |
| | | 02/28 | ශේෂය ප/ගෙ | | *25 | | | | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 25 | | 03/01 | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| 1975 | | 03/01 | මුදල් | | | | | | | |

* ( තරු ලකුණ යෙදූ අගයන්ට ලකුණු 1/2 බැගින් )

(ආ) (1)

(ආ) බැංකු ගිණුම (සංයෝධනය කිරීම)

| | | | |
|---|---|---|---|
| 2021 දෙසැ 31 ශේෂය ඉ/ගෙ | 25, 000 | ස්ථාවර නියෝග සංරක්ෂණය (1/2) | 8, 000 |
| සෘජු ප්‍රේෂණ (1/2) | 6,000 | ශේෂය ප/ගෙ (01) | 23,000 |
| | 31,000 | | 31,000 |

(ලකුණු 02)

(2)

21/12/31 දිනට බැංකු සැසඳුම් විස්තරය

| | | |
|---|---|---|
| බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය | 23 000 | (01) |
| (+) නිකුත් කල ඉදිරිපත් නොවූ චෙක් | 11 000 | (01) |
| | 34 000 | |
| (-) තැන්පත් කල නිශ්කාශනය නොවූ චෙක් | (15 000) | (01) |
| බැංකු ප්‍රකාශයේ ශේෂය | 19 000 | |

(ලකුණු 04)

(මුළු ලකුණු 04)

(07)

(ආ) (1)

ගැණුම් ජ'නලය

| දිනය 2022 | ඉ.අ. | සැපයුම්කරු | මුළු වට්නාකම රු. | ලෙ.පි. |
|---|---|---|---|---|
| 01/10 | 007 | විමල් | 5 000 | |
| 01/18 | 216 | සුනෙත් | 16 000 | |
| 01/25 | 720 | ජගත් | 5 000 | |
| * 01/31 | | ගැනුම් ගිණුමට හර කළා (1/2) * | 26 000 | (1/2) |

* දිනය විස්තරය එකතුව නිවැරදිව දක්වීමට (ලකුණු 01)

(2)

| දිනය 2022 | ඉ.අ. | ගැණුම්කරු | මුළු වට්නාකම රු. | ලෙ.පි. |
|---|---|---|---|---|
| 01/05 | 546 | වෙනුර | 5 000 | |
| 01/16 | 547 | සිල්වා | 8 000 | |
| 01/27 | 548 | විහඟි | 10 000 | |
| * 01/31 | | විකුණුම් ගිණුමට හර කළා (1/2) * | 23 000 | (1/2) |

* දිනය විස්තරය එකතුව නිවැරදිව දක්වීමට (ලකුණු 01)

(2)

### ගැණුම් ගිණුම

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/31 | විවිධ ණය හිමියෝ | | 26 000 | | | | |

### විමල්

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01/10 | ගැණුම් | | 5 000 |

### සුනෙත්

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01/18 | ගැණුම් | | 16 000 |

### ජගත්

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01/25 | ගැණුම් | | 5 000 |

### විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 01/31 | විවිධ ණය ගැතියෝ | | 23 000 |

### වෙනුර

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/05 | විකුණුම් | | 5 000 | | | | |

### සිල්වා

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/16 | විකුණුම් | | 8 000 | | | | |

### විහඟ

| දිනය | විස්තරය | සා.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 01/22 | විකුණුම් | | 10 000 | | | | |

නිවැරදි ගිණුමකට ලකුණු 1/4 බැගින් ගිණුම් 8 සඳහා ලකුණු 04)

| | | | | රු | රු. |
|---|---|---|---|---|---|
| (ආ) | (1) | මුදල් පොත | හර | 30 000 | |
| | | විකුණුම් ගිණුම | බැර | | 30 000 |
| | (2) | මුදල් පොත | හර | 12 000 | |
| | | ණයගැතියෝ | බැර | | 12 000 |
| | (3) | බැංකු ණය ගිණුම | හර | 8 000 | |
| | | ණයගැතියෝ | බැර | | 8 000 |
| | (4) | ගොඩනැගිලි ගිණුම | හර | 10 000 | |
| | | ප්‍රාග්ධන ගිණුම | බැර | | 10 000 |
| | (5) | ණය හිමියෝ | හර | 3 000 | |
| | | මුදල් පොත | බැර | | 3 000 |
| | (6) | රක්ෂණ ගාස්තු ගිණුම | හර | 4 000 | |
| | | මුදල් පොත | බැර | | 4 000 |

(නිවැරදි එකකට ලකුණු 01 බැගින් ලකුණු 06)

(මුළු ලකුණු 12)

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

පිළිතුරු පත්‍රය - **II** කොටස

### I පත්‍රය

| | |
|---|---|
| (1) - 3 | (9) - 2 |
| (2) - 4 | (10) - 2 |
| (3) - 3 | (11) - 3 |
| (4) - 3 | (12) - 3 |
| (5) - 4 | (13) - 3 |
| (6) - 4 | (14) - 3 |
| (7) - 3 | (15) - 2 |
| (8) - 4 | (16) - 4 |

(1x16) = 16

### II පත්‍රය
### ව්‍යාපාර අධ්‍යයනය I

(1) (අ) ඇඳුම් - සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුම්
මුහුණු ආවරණ

(ආ) නිෂ්පාදන ව්‍යාපාරයක් (ලකුණු 2)

(2) (අ) ♦ කමල් ඇඳුම් නිර්මාණකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙක් වීම
♦ පුහුණුව ලැබූ ඇඳුම් මසන්නෙකු බඳවා ගැනීම♦ මූල්‍ය ශක්තියක් තිබීම (ලකුණු 1)

(ආ) කමල්
සේවකයා
සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් (වෛද්‍ය, හෙද, මහජන සෞඛ්‍ය පරීක්ෂක)
වැඩිහිටියන් හා ළදරුවන්
ලංකා බැංකුව (ලකුණු 1)

(3) ප්‍රාග්ධනය - මුදල්, මහන මැෂිම,
ශ්‍රමය - පුහුණු ශ්‍රමය, කමල්ගේ ශ්‍රමය
ව්‍යුහය - සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුම් හා මුහුණු ආවරණ නව නිර්මාණයක් ලෙස
සලකා කමල්ගේ ශ්‍රමය (ලකුණු 2)

(4) වෘත්තීය පුහුණු ආයතන, ලංකා බැංකුව (ලකුණු $^1/_2$ x 2)
රාජ්‍ය සංස්ථා (ලකුණු 1)

(5) වත්කම් = හිමිකම් + වගකීම්

(6) මුදල් ගිණුම - වවුචර්ස්, ලදුපත
දෛනික විකුණුම් පොත - විකුණුම් ඉන්වොයිසිය

(7) මුදල් පොත

| දිනය | ලදුපත් අංකය | විස්තරය | සඟල පිටුව | වටිනාකම | දිනය | වවුචර් අංකය | විස්තරය | සඟල පිටුව | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01/01 | | ප්‍රාග්ධනය | | 20000 | 01/01 | | මහන මැෂිම | | 25000 |
| 01/01 | | බැංකු ණය | | 5000 | 01/02 | | ගැණුම් (ඇඳුම්) | | 30000 |
| 01/08 | | විකුණුම් | | 30000 | 01/03 | | ගැණුම් (මුහුණු ආවරණ) | | 10000 |
| | | | | | 01/04 | | ප්‍රවාහන කුලී | | 2000 |
| | | | | | 01/05 | | දුරකථන බිල | | 1500 |
| | | | | | 01/20 | | වැටුප් | | 20000 |
| | | | | | 01/25 | | බැංකු ණය (වාරික) | | 5000 |
| | | | | | 01/31 | | ශේෂය | | 186 |
| | | | | 280000 | | | | | 280000 |

නිවැරදි ආකෘතිය ලකුණු 1/2
නිවැරදි ශේෂයට ලකුණු 1/2
නිවැරදි අයිතම 10 ට ලකුණු 01
නිවැරදි අයිතම 10 - 5 ත් අතර ලකුණු $^1/_2$

(8) ජංගම නොවන වත්කම - මහන මැෂිම රු. 25000
ජංගම වත්කම - මුදල් රු. 186500
ණයගැතියෝ - (සෙන්ට්‍රල් ෆාමසි) රු. 10000

(ලකුණු 2)
වටිනාකම තිබිය යුතුය

(9) සෙන්ට්‍රල් ෆාමසි ගිණුම හර 10000
විකුණුම ගිණුම බැර 10000

(ලකුණු 2) වටිනාකම තිබිය යුතුය

(10) 2021. 01. 31 දිනට වගකීම් - රු. 45,000/-
2021. 01. 31 දිනට හිමිකම් - රු. 816,500.00

## I කොටස

(1) (අ) ජීවත් වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයයෙන්ම සපුරා ගත යුතු දෑ මිනිස් අවශ්‍යතා වේ.

(ආ)
- අත්‍යවශ්‍ය වීම
- පොදු වීම
- නිර්මාණය කළ නොහැකි විට
- සීමිත විට

ii. (අ) අසත්‍ය
(ආ) සත්‍ය
(ඊ) අසත්‍ය
(ඊ) අසත්‍ය

iii. (අ) ප්‍රාග්ධනය - යන්න
ශ්‍රමය - පළපුරුදු සේවකයාගේ ශ්‍රමය
(ආ) අවස්ථාව - බීම් අතුරන ගල් සඳහා විශාල ඉල්ලුමක් පැවතීම
ශක්තිය - පළපුරුදු සේවකයකු සිටීම
මූල්‍ය ශක්තිය තිබීම

iv. අයිතිකරු - ශිරාණි
ගනුදෙනුකරුවන් - මං තීරුවල ඇවිදින්නන්
සැපයුම්කරුවන් - අවශ්‍ය කොල වර්ග සපයන අය
තරගකරුවන් - අනෙකුත් කොළ කැඳ සපයන්නන්

v. අයිතිකරු - ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීමට / ව්‍යාපාර වර්ධනය
ගනුදෙනුකරුවන් - නිෂ්පාදන ගුණත්වය හා සාධාරණ මිල
සැපයුම්කරුවන් - අඛණ්ඩ ඇනවුම් හා මුදල් ලබා ගැනීම
තරගකරුවන් - තම නිෂ්පාදන වල මිල තීරණය, තරගයට ????

1. (අ) ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශ්ව සහ ව්‍යාපාරය තුළ පවතින අනෙකුත් සාධක අභ්‍යන්තර පරිසරය ලෙස හැඳින්විය හැකිය.

(ආ) අයිතිකරුවන්, සේවකයන්, කළමනාකරුවන් (ලකුණු 1x2)

2. (අ) අසත්‍ය
(ආ) අසත්‍ය
(ඉ) අසත්‍ය
(ඊ) සත්‍ය (ලකුණු $^1/_2$ x 4 = 02

3. (ආ) තාක්ෂණික පරිසරය
(ආ) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම
නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම
ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම
පරිසරය ආරක්ෂා කිරීම
(ලකුණු 01x2)

4. (අ) දේශපාලන පරිසරය
(ආ) ප්‍රාග්ධනය
(ලකුණු 01 x 2)

(03)

1. (අ)

ව්‍යාපාර සංවිධාන
- පෞද්ගලික
  - ඒක පුද්ගල ව්‍යාපාර
  - හවුල් ව්‍යාපාර
  - සංස්ථාපිත සමාගම්
  - සමුපකාර සමිති
  - සමිති සංවිධාන
- රාජ්‍ය (පොදු)
  - මධ්‍යම රජය
  - පළාත් සභා
  - පළාත් පාලන ආයතන
  - යටතේ පවතින ව්‍යාපාර

(ආ) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
සේවක සංඛ්‍යාව
භාවිතා කරන බලශක්ති ප්‍රමාණය
ව්‍යාපාරයට ඇති වෙළෙඳ පළ කොටස

2.

(අ) අසත්‍ය

(ආ) සත්‍ය

(ඉ) සත්‍ය

(ඊ) සත්‍ය

(ලකුණු 1/2 x 4 = 2)

3. (අ) වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුව

(ආ) ආරම්භක ප්‍රාග්ධනය රු. 1000 ට වැඩි බැවින් හවුල් ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වා ගත යුතුය.
මෙම ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව වේ.

(ලකුණු 1x2 = 02)

4. (අ) ඔව්
තමාගේ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වා ගෙන යෑම

(ආ) අනන්‍යතාවයක් ලැබීම
ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම
රජයෙන් ලබා දෙන දිරි දීමනා ලබා ගැනීමට පහසුකම් වීම
ණය ගැනීමට පහසුවක් වීම